# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# Annual Report 2012




## ශ්‍රම වාසනා අරමුදල

## சிரமவாசனாநிதியம

## ShramaVasana Fund


**6 වන මහල, කම්කරු මහ ලේකම් කාර්යාලය, නාරාහේන්පිට, කොළඹ 05**

**ஆவதுதளம்,தொழில் செயலகம்,நாரஹென்பிட்டி,கொழும்பு 05.**

**6th Floor, Labour Secretariat, Narahenpita, Colombo-05.**

# පටුන

පිටුව

## 1 කොටස


දැක්ම හා මෙහෙවර 03

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාගේ සුභ පැතුම් පණිවිඩය 04

කම්කරු හා කම්කරු සබඳතා නියෝජ්‍ය අමාත්‍යතුමාගේ සුභ පැතුම් පණිවිඩය 05

ශ්‍රම වාසනා අරමුදලේ සභාපති/ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය 06

ශ්‍රම වාසනා අරමුදලේ අධ්‍යක්ෂ/ කම්කරු කොමසාරිස් ජෙනරාල්තුමියගේ පණිවිඩය 07

ශ්‍රම වාසනා අරමුදලේ සාමාන්‍යාධිකාරිතුමාගේ පණිවිඩය 08


## 2 කොටස


ශ්‍රම වාසනා අරමුදලේ වර්ධනය, ලොතරැයි ආදායම 09

ශ්‍රම වාසනා අරමුදල, ශ්‍රම වාසනා අරමුදලේ අරමුණු, ශ්‍රම වාසනා අරමුදල සඳහා ලැබීම් 10

ශ්‍රම වාසනා අරමුදලේ වැඩසටහන් සමාලෝචනය 11

පාලන ව්‍යුහය 16

ශ්‍රම වාසනා අරමුදලේ අවසාන ගිණුම - 2012

- ශ්‍රම වාසනා අරමුදලේ ශේෂ පත්‍රය 18
- ශ්‍රම වාසනා අරමුදලේ ආදායම් වියදම් ගිණුම් 19
- ශ්‍රම වාසනා අරමුදලේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය 20
- පාද සටහන් 21


## 3 කොටස



විගණකාධිපති වාර්තාව 25

# දැක්ම ( Vision )

**"තෘප්තිමත් ශ්‍රම බලකායක්"**

# මෙහෙවර ( Mission )

**"ව්‍යසනයන්හිදී පිහිට වෙමින් සේවක සුභසාධනය ප්‍රවර්ධනය ඉහළ නංවමින් යහපත් වැඩ බිමක් නිර්මාණය කිරීම."**



# කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාගේ සුභ පැතුම් පණිවිඩය.

ශ්‍රම වාසනා අරමුදල විසින් පලකරනු ලබන වාර්ෂික වාර්තාවට කම්කරු විෂයභාර අමාත්‍යවරයා විධියට සුභපැතුම් පණිවිඩයක් ඉදිරිපත් කරන්නේ ඉතාම සතුටිනි.

කාර්යක්ෂම සහ ඵලදායි ශ්‍රම බලකායක් රටක සංවර්ධනයට බෙහෙවින්ම ඉවහල් වේ. ශ්‍රම වාසනා අරමුදල විසින් කාර්යක්ෂම, ඵලදායි හා නිරෝගි ශ්‍රම බලකායක් ඇති කිරීමේ අරමුණින් විවිධ වැඩසටහන් දීප ව්‍යාප්තව සිදුකරනු ලබන අතර ඒ වෙනුවෙන්ම කැපවී කටයුතු කරනු ලබයි.

සුවහසක් වැඩකරන ජනතාවගේ සුභසාධනය වෙනුවෙන් කැප වී කටයුතු කරන අමාත්‍යාංශයේ ලේකම් තුමා, දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සහ ශ්‍රම වාසනා අරමුදලේ කාර්ය මණ්ඩලයට මාගේ ස්තූතිය හිමිවන අතර ලංකාව ආසියාවේ ආශ්චර්යය කරා යන ගමනේදී රටේ වැඩ කරන ජනතාවට මහගු සේවයක් කිරීමට ශ්‍රම වාසනා අරමුදලට හැකිවේවායි ප්‍රාර්ථනා කරමි.

**ගාමිණී ලොකුගේ**

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී හා

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.



# කම්කරු හා කම්කරු සබඳතා නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය

ශ්‍රමවාසනා අරමුදල මගින් පල කෙරෙන වාර්ෂික වාර්තාව සඳහා මගේ සුභාශිංසන පණිවිඩය ඉදිරිපත් කරන්නේ ඉතාම සතුටිනි.

ශ්‍රම වාසනා අරමුදල, ස්ථාපිත ව්‍යවස්ථාපිත රාමුව ඇතුලත, ශ්‍රී ලංකා ශ්‍රමිකයන්ගේ අභිවෘද්ධිය සඳහා කර ඇති මෙහෙවර මම ඉතා අගය කරමි. ශ්‍රමිකයන්, ඔවුන්ටත්, සේවා යෝජකයන්ටත්, රටටත් වාසනාව ගෙනෙන ඉතාමත් වැදගත් දායක පිරිසක් වේ. ඔවුන්ගේ ශ්‍රම දායකත්වයේ මූලික ප්‍රතිලාභය, වැටුප සේ සැලකීම ඔවුන්ගේ මෙහෙවර, ප්‍රතිලාභයකට කොටු කිරීමක් වේ.

එම ශ්‍රම දායකත්වයේ විපුල ඵලය, මුළු සමාජය පුරා සිසාරා, පෘථුලව පැතිර යන බව කිවමනාමය. එය මගේ විශ්වාසයයි. එයින් ඇති කරවන සමාජමය වටිනාකම, මූල්‍යමය වශයෙන් පමණක් ගැන බැලීමට අප ඉදිරිපත්විය යුතු නැත. එම උතුම් කාර්යය, එලෙසින්ම, සද්භාවයෙන් යුතුව අගය කළයුතුමය.

එහෙයින්, එම අසීමිත වටිනාකම් අගය කිරීමක් වශයෙන් සහ ඔවුන්ගේ හිත සුව පිණිස මෙම අරමුදලෙන් ඔවුන්ට පිරිණමන පහසුකම් හා සේවා, සැබැවින්ම කෘතගුණතාවය නිරූපණය කරන මහගු නිදසුනකි. එම කටයුතු සඳහා සිය සේවා දායකත්වය කැප කරන කාර්ය මණ්ඩලයට මාගේ සුභාශිංසනය පිරිණමන අතර එය තවත් පුළුල් සේවා කළඹක් ලෙස ඉදිරිපත් කිරීමට ඔවුනට හැකිවේවා යැයි ප්‍රාර්ථනාකරමි.

**සරත් පී වීරසේකර**

කම්කරු හා කම්කරු සබඳතා නියෝජ්‍ය අමාත්‍ය



## ශ්‍රම වාසනා අරමුදලේ සභාපති/ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යංශය යටතේ පවතින ශ්‍රම වාසනා අරමුදල විසින් ඉදිරිපත් කරනු ලබන වාර්ෂික වාර්තාවට පණිවුඩයක් නිකුත් කරන්නේ ඉමහත් සතුටිනි.

රටේ සුවහසක් වැඩකරන ජනතාවගේ සුභසාධනය උදෙසා ශ්‍රම වාසනා අරමුදල විසින් සිදුකරන ලද මෙහෙවර අතිමහත්ය.වැඩකරන ජනතාව වෙනුවෙන් සවිබල ගැන්වීමේ වැඩසටහන් වෛද්‍ය සායන, අක්ෂි වෛද්‍ය සායන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් දීප ව්‍යාප්තව සංවිධානය කරමින් ඔවුන්ගේ සෞඛ්‍ය ආර්ථික හා මානසික ශක්තිය වර්ධනය කර ගැනීමට කරන ලද දායකත්වය ඉතා වැදගත්ය.

ශ්‍රම වාසනා අරමුදලේ සුවිශේෂී වූ අරමුණු ඔස්සේ යමින් නිරෝගී සෞඛ්‍ය සම්පන්න ශ්‍රම බලකායක් බිහි කිරීමට පමණක් නොව ඔවුන්ගේ කුටුම්බයන් සවිබල ගැන්වීම සහ සංරක්ෂණය කිරීමට කරනු ලබන මෙහෙය ප්‍රසංශනීය වේ.

මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය නායකත්වය දෙමින් අප සමඟ කටයුතු කරන කම්කරු අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මැතිතුමාටත් නියෝජ්‍ය අමාත්‍ය ගරු සරත් පී. වීරසේකර මැතිතුමාටත් මාගේ කෘතඥතාව ප්‍රකාශ කර සිටිමි.

එමෙන්ම මෙම කාර්යයන් සාර්ථකව කර ගැනීමට සහයෝගය ලබා දෙන කම්කරු සබඳතා අමාත්‍යාංශයේ කම්කරු දෙපාර්තුමේන්තුවේ ඇතුළු අනෙකුත් ආයතන වල සියළුම කාර්යමණ්ඩලවලටත් මාගේ ස්තූතිය පුද කර සිටිමි.

තවද ශ්‍රම වාසනා අරමුදලේ අභිවෘද්ධිය උදෙසා අනුපමේය සේවාවක් කරන එහි සාමාන්‍යාධිකාරීතුමා ඇතුළු සියළු කාර්යමණ්ඩලයට ද මාගේ කෘතඥතාව ප්‍රකාශ කර සිටිමි.

**ඩබ්. ජේ. එල්. යූ. විජයවීර**
ලේකම් / සභාපති ශ්‍රම වාසනා අරමුදල



## ශ්‍රම වාසනා අරමුදලේ අධ්‍යක්ෂ (කම්කරු කොමසාරිස් ජනරාල් ) ගේ පණිවුඩය.

ශ්‍රම වාසනා අරමුදලේ වාර්ෂික වාර්තාවට සුභ පැතුම් පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම භාග්‍යයක් සේ සළකමි.

පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ සුභ සාධනය සළසා දීම ප්‍රධාන අරමුණ කර ගනිමින් 1998 අංක 12 දරණ ශ්‍රම වාසනා අරමුදල් පණත නීතිගත විය. ඒ අනුව සේවා නියුක්තිකයන්ගේ සේවා ස්ථානය පූර්ව දැනුම් දීමකින් තොරව වසා දැමූ අවස්ථා වලදී මූල්‍ය හා වෙනත් ආධාර ශ්‍රම වාසනා අරමුදල මගින් ප්‍රධානය කරනු ලබයි. එසේම සේවකයකුගේ රෝගී අවස්ථාවක, වෛද්‍යාධාර හා අනෙකුත් පහසුකම් සැපයීමද, කිසියම් ව්‍යසන අවස්ථාවකදී සේවකයන්ට හෝ යැපෙන්නන්ට මූල්‍ය හෝ වෙනත් ආධාර ප්‍රධානය කිරීමද මෙම අරමුදල මගින් කරනු ලබන මහගු සේවාවන්ය. එසේම සේවක සුභ සාධනය වෙනුවෙන් සුවිශේෂී මෙහෙවරක් කර ඇති අය ඇගයීම සඳහා, පරිත්‍යාගයන්ද කළ හැකිවාක් මෙන්ම, ශිෂ්‍යත්ව, පරිත්‍යාග, ආධාර ලබා දීමට මෙම පනතේ ප්‍රතිපාදන සැළසී ඇත.

එකී අරමුණු සාක්ෂාත් කර ගැනීම වස් ශ්‍රම වාසනා අරමුදල ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා ශ්‍රම වාසනා අරමුදලේ කාර්ය මණ්ඩලය විවිධ වැඩසටහන් දීප ව්‍යාප්තව දියත් කරමින් ලබා දෙන දායකත්වය අගය කළ යුතු වේ. එම කාර්යයන් සඵලමත් කර ගැනීමට කම්කරු දෙපාර්තමේන්තුවේ දීප ව්‍යාප්තව පිහිටුවා ඇති නියෝජ්‍ය කම්කරු කොමසාරිස් කාර්යාල, දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල වලින් අවශ්‍ය සම්බන්ධීකරණය ලබා, වෛද්‍ය සායන, සේවකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් ආදිය පවත්වමින් සේවක සුභ සාධනය වැඩිදියුණු කිරීම උදෙසා ගෙන යන ප්‍රයත්නය පැසසිය යුතුවේ.

එයට අමතරව ශ්‍රම වාසනා ලොතරැයිය තුලින් ලැබෙන ආදායම් වැඩි දියුණු කර ගැනීම තුලින් ප්‍රජා සත් කාර්යයන් වැඩි දියුණු කිරීමට, ශ්‍රම වාසනා අරමුදලට හැකි බව දකිමි. දුම් පානය, මත් ද්‍රව්‍ය භාවිතය, බුලත් සැපීම වැනි නිරර්ථක වැය කිරීම් අඩුකොට, එම මුදල් මෙවැනි ඵලදායි මෙහෙවරකට යොමු කර ශ්‍රම වාසනා ලොතරැයිය අලෙවිය වැඩි දියුණු කිරීම තුලින් අරමුදල ශක්තිමත් වනවා මෙන්ම, එමගින් කළහැකි ප්‍රජා සත්කාරයන් තවදුරටත් වර්ධනය කිරීමට හැකි වනු ඇත. එය සේවයේ නියුතු වූවන්ගේ ප්‍රසාදයට හේතු වනු නොඅනුමානය. ශ්‍රම වාසනා අරමුදලේ කටයුතු සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවායි සුභාසිංශනය කරමි.

පර්ල් වීරසිංහ මිය

අධ්‍යක්ෂ - ශ්‍රම වාසනා අරමුදල

කම්කරු කොමසාරිස් ජනරාල්



## ශ්‍රම වාසනා අරමුදලේ සාමාන්‍යාධිකාරිතුමාගේ පණිවුඩය.

ශ්‍රී ලංකාවේ සුවහසක් වැඩකරන ජනතාවගේ සුභ සාධනය ඉහල නැංවීම පිණිස ආරම්භ කරන ලද ශ්‍රම වාසනා අරමුදලේ 2012 වාර්ෂික වාර්තාව වෙනුවෙන් පණිවුඩයක් තිකුත් කරනුයේ හද පිරි සතුටිනි.

1998 අංක 12 දරණ පනතට අනුව ශ්‍රී ලාංකීය ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිඳුන්ගේ සංකල්පයකට අනුව බිහි වූ ශ්‍රම වාසනා අරමුදලේ අභිප්‍රාය වන්නේ, වැඩකරන සුවහසක් කම්කරු ජනතාවගේ සුභ සාධනය ඉහළ නංවා ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත් කරමින් තෘප්තිමත් ශ්‍රම බලකායක් බිහි කිරීමයි. මෙම අරමුදලේ සංවර්ධන කාර්යයන් සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් වන්නේ ජාතික ලොතරැයි මණ්ඩලය හා ඒකාබද්ධව පවත්වා ගෙන යනු ලබන " ජාතික සම්පත" ලොතරැයියෙනි. ශ්‍රම වාසනා අරමුදලේ ප්‍රධාන අරමුණු ලෙස සේවා නියුක්තිකයන්ගේ සුභ සාධනය ඉහළ නැංවීම, පූර්ව දැනුම් දීමකින් තොරව ආයතනය වසා ඇති අවස්ථාවක එම සේවා නියුක්තිකයන්ට මූල්‍ය හා වෙනත් ආධාර සැපයීම වැනි විවිධ වූ කරුණු රාශියක් ඔස්සේ සේවා නියුක්තිකයන් හට සහන උදා කර දී තිබේ.

ශ්‍රම වාසනා අරමුදල මගින් සමස්ත වැඩ කරන ජනතාවට පමණක් නොව ඔවුන්ගේ කුටුම්භයන් ද සවිබල ගැන්වීම හා සංරක්ෂණය කිරීම අරමුණු කොට ගෙන පස් අවුරුදු සංයුක්ත සැලැස්මක් මේ වන විට සම්පාදනය කොට ඇත. එසේම අරමුදලේ කාර්යයන් විමධ්‍යගත කොට දිවයින පුරා විසිරී සිටින සේවා ලාභීන්ට වඩාත් ඵලදායි සේවාවක් සැලසීම අරමුණු කොටගෙන හා මෙම අරමුදලේ තොරතුරු ජනතාව අතර ප්‍රචලිත කිරීම උදෙසා ප්‍රචාරක පුවරු මෙන්ම තොරතුරු තාක්ෂණ ක්‍රම වේද ප්‍රශස්ත අයුරින් යොදා ගනු වස් වෙබ් අඩවියක්ද නිර්මාණය කොට ඇත.

මීට අමතරව දිස්ත්‍රික්කයේ බොහෝ පළාත් ආවරණය වන පරිදි වෛද්‍ය සායන, අක්ෂි සායන, පවත්වමින් වැඩකරන ජනතාවගේ සෞඛ්‍ය නංවාලීමට සහ කම්කරු නීති රීති අණපනත් පිළිබඳව සේවක සේවිකාවන් දැනුවත් කිරීම, වැනි විශාල වැඩසටහන් රාශියක් සිදු කරමින් ශ්‍රී ලාංකීය ජනතාවගේ ශ්‍රම ඵලදායිතාවය ඉහළ නංවා ශක්තිමත් ආර්ථිකයකට උර දීමට කටයුතු සලසා දී ඇත.


කම්කරු පංතියේ දුක් ගැහැට මුසු වූ දහඩිය සුවඳ හොඳින් හඳුනන සංවේදී මිනිසෙකු වූ ශ්‍රම වාසනා අරමුදලේ නිර්මාතෘ මෙන්ම වර්තමාන ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිඳුන්ටත් සියලු වැඩසටහන් සඳහා මග පෙන්වනු ලබන කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මැතිතුමාටත්, එම අමාත්‍යාංශයේ ලේකම් හා ශ්‍රම වාසනා අරමුදලේ සභාපති ඩබ්. ජේ. එල්. යූ. විජයවීර මැතිතුමා ඇතුලුව කම්කරු අමාත්‍යාංශය, කම්කරු දෙපාර්තමේන්තුව හා ශ්‍රම වාසනා අරමුදල් කාර්යය මණ්ඩලයේ සියලුම නිලධාරි මහත්ම මහත්මීන් හට මාගේ හෘදයාංගම ස්තුතිය පුද කර සිටිමි.

ඩී. ආර්. ජයලත්
සාමාන්‍යාධිකාරි
ශ්‍රම වාසනා අරමුදල

රූප සටහන් 1

## ශ්‍රම වාසනා අරමුදලේ වර්ධනය


| | 2008 (මිලියන) | 2009 (මිලියන) | 2010 (මිලියන) | 2011 (මිලියන) | 2012 (මිලියන) |
|---|---|---|---|---|---|
| අරමුදලේවටිනාකම | 87 | 118 | 148 | 187 | 234 |
| අරමුදලේ වර්ධනය | 27 | 31 | 30 | 39 | 47 |




රූප සටහන් 2

## ලොතරැයි ආදායම්

| | 2008 (මිලියන) | 2009 (මිලියන) | 2010 (මිලියන) | 2011 (මිලියන) | 2012 (මිලියන) |
|---|---|---|---|---|---|
| ආදායම | 23 | 26 | 28 | 39 | 49 |
| ආදායම වර්ධනය | 6 | 3 | 2 | 11 | 10 |



## ශ්‍රම වාසනා අරමුදල

1998 අංක 12 දරණ පනතින් ස්ථාපිත ශ්‍රම වාසනා අරමුදල කම්කරු හා කම්කරු අමාත්‍යාංශය යටතේ පවතින කම්කරු සුභ සාධනය උදෙසා ආරම්භ කරන ලද ආයතනයකි. ශ්‍රම වාසනා අරමුදල පනතේ අරමුණු 6 ඔස්සේ ආරම්භයේ සිට මේ දක්වා විවිධ සුභ සාධන වැඩසටහන් පවත්වා ශ්‍රී ලාංකීය සේවා නියුක්තිකයින්ගේ උන්නතියට කටයුතු සම්පාදනය කර ඇත.

ශ්‍රම වාසනා අරමුදල වෙත ප්‍රධාන ආදායම් මාර්ගය ලෙස ජාතික ලොතරැයි මණ්ඩලය විසින් ලබා දෙන දායකත්වය ජාතික සම්පත ලොතරැයි අලෙවියත් සමග ක්‍රම ක්‍රමයෙන් වැඩිවෙමින් පවතින අතර එම දායකත්වය වැඩිවීමත් සමග කම්කරු සුභ සාධනය උදෙසා සිදු කිරීමට නියමිත සේවාවන් ද මේ සමග වර්ධනය කර ගත හැක.

### ශ්‍රම වාසනා අරමුදලේ අරමුණු

(අා) සේවා නියුක්තයන්ගේ සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම.

(ආ) සේවා නියුක්තයන් සේවයෙහි යෙදී සිටි ආයතන පූර්ව දැනුම් දීමකින් තොරව වසා දැමූ අවස්ථාවක, ඒ සේවා නියුක්තයන්ට මූල්‍ය හා වෙනත් ආධාර සැපයීම.

(ඇ) හදිසි අවස්ථාවල දී සේවා නියුක්තයන්ට වෛද්‍ය හා වෙනත් පහසුකම් සැපයීම.

(ඈ) සේවා නියුක්තයන්ට විරුද්ධව පරීක්ෂණ ආරම්භ කරනු ලැබූ විටක දී ඔවුන්ට තාවකාලික ආධාර සැපයීම.

(ඉ) ව්‍යසන අවස්ථාවල දී සේවා නියුක්තයන්ට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ සැපයීම.

(ඊ) සේවා නියුක්තයන්ගේ සුභ සාධනය සඳහා විශිෂ්ට සේවයක් කර ඇති තැනැත්තන්ට ත්‍යාග පිරිනැමීම.

### ශ්‍රම වාසනා අරමුදල සඳහා ලැබීම්

(අ) පාර්ලිමේන්තුව විසින් අරමුදලේ අරමුණු ඉටුකර ගැනීමේ කාර්ය සඳහා කලින් කල සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල්.

(ආ) දේශී හෝ විදේශීය ප්‍රභවයන්ගේන් ප්‍රධාන, ත්‍යාග හෝ පරිත්‍යාග වශයෙන් ලැබෙන සියලුම මුදල්

(ඇ) අරමුදල මගින් කරන ආයෝජනවලින් ආදායම වශයෙන් ලැබෙන මුදල්

(ඈ) 13 වන වගන්තියේ සඳහන් ලොතරැයි වලින් ලැබෙන මුදල් ද ඇතුලුව, මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේදී සහ කර්තව්‍ය ඉටු කිරීමේදී අරමුදල ලැබෙන සියලු මුදල් ශ්‍රම වාසනා අරමුදල

පෞද්ගලික අංශයේ සේවකයින් ආවරණය වන පරිදි පිහිටුවා ඇති අතර ස්වයං රැකියා කරනු ලබන පිරිස මෙමගින් ආවරණය නොවේ. ශ්‍රම වාසනා අරමුදලේ මූල්‍ය ධාරිතාව මත විවිධ වැඩසටහන් එක් එක් සීමාවන් තුළ ක්‍රියාත්මක කරනු ලැබේ. මූල්‍ය ධාරිතාව වැඩිවීමත් සමග එම සීමා වලින් ඔබ්බට තව දුරටත් සේවාවන් පුළුල් කිරීම 2012 වර්ෂයේදී සිදු කරන ලදි.

## ශ්‍රම වාසනා අරමුදලේ වැඩසටහන් සමාලෝචනය

ශ්‍රී ලංකාව තුළ පැවති අභ්‍යන්තර ගැටුම් දශක තුනක් පුරා පැවති අතර එය 2009 වර්ෂයේදී අවසන් වාතාවරණයක් සහ දේශපාලන ස්ථාවර භාවය හේතු කොටගෙන ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය ඉතා සීඝ්‍ර වර්ධනයක් දක්නට ලැබුණි.

එහි ප්‍රතිඵලයක් ලෙස විදේශ ආයෝජන විශාල ප්‍රමාණයක් ශ්‍රී ලංකාව තුළ ආයෝජනය කර විශාල රැකීරක්ෂා ප්‍රමාණයක් ශ්‍රී ලංකාව තුළ උද්දීපණය විය. මෙමගින් වැඩි ශ්‍රම බලකායක් ශ්‍රී ලංකාව තුළවර්ධනය වූ අතර මේ වන විට ශ්‍රම බලකාය මිලියන 8.7 පමණ වේ.

ශ්‍රම වාසනා අරමදල විසින් විවිධ අරමුණු ඔස්සේ ක්‍රියාත්මක කරන වැඩසටහන් ශ්‍රම වාසනා අරමුදල අරමුණු 6 ඔස්සේ සේවක සුභ සාධනය ඉහළ නැංවීමට කටයුතු කරන අතර එක් එක් අරමුණු ඔස්සේ ක්‍රියාත්මක කරන ලදි.

(අ) සේවා නියුක්තයන්ගේ සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම.

1. ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීමට සමගාමීව සේවා නියුක්තයන්ගේ සුභ සාධනය ප්‍රවර්ධනය උදෙසා පවත්වන ලද වැඩසටහන ( වැය :- රු. 302,000)

2. සේවකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.



**සේවා නියුක්තිකයන් වෙනුවෙන් බියගම දී පවත්වනු ලැබූ දැනුවත් කිරීමේ වැඩසටහන**

(අ) හදිසි අවස්ථාවල දී සේවා නියුක්තයන්ට වෛද්‍ය හා වෙනත් පහසුකම් සැපයීම.



**සේවා නියුක්තිකයන්ගේ මනා සෞඛ්‍ය නැංවීම සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කයේදී සේවා නියුක්තිකයන්ට වෛද්‍ය සායන/අක්ෂි සායන පැවැත්වීම.**

(ඇ) සේවා නියුක්තයන්ට විරුද්ධව පරීක්ෂණ ආරම්භ කරනු ලැබූ විටක දී ඔවුන්ට තාවකාලික ආධාර සැපයීම.

නීති ආධාර වැඩසටහන යටතේ සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් 18 දෙනෙකුට ආධාර ලබා දීම.
(වැය : රු. 76,250/=)

(ඇ)ව්‍යසන අවස්ථාවල දී සේවා නියුක්තයන්ට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ සැපයීම:-

මරණීය අනතුරු වලින් විපතට පත් සේවා නියුක්තයන්ගේ දූ දරුවන් හට ශිෂ්‍යත්ව ලබා දීම.



අනුරාධපුරයේ පැවැත්වූ , සේවයේ යෙදී සිටියදී අනතුරට හා පූර්ණ ආබාධිත තත්ත්වයට පත් වූ සේවා නියුක්තිකයන්ගේ දූ දරුවන් සඳහා ශිෂ්‍යත්ව හා පාසැල් උපකරණ කට්ටල බෙදා දීමේ වැඩසටහන."

- ශ්‍රම වාසනා අරමුදල සහ එහි අරමුණු ජනතාව අතර ප්‍රචලිත කිරීමේ අරමුණින් නව වෙබ් අඩවියක් විවෘත කිරීම.



නව වෙබ් අඩවිය විවෘත කිරීම

- ශ්‍රම වාසනා අරමුදල සහ එහි අරමුණු ජනතාව අතර ප්‍රචලිත කිරීමේ අරමුණින් අලෙවි ප්‍රවර්ධන වැඩසටහනක් පැවැත්වීම.




**අලෙවි ප්‍රවර්ධන වැඩසටහන පැවැත්වීම.**

- ශ්‍රම වාසනා අරමුදලේ අරමුණු ඉටු කර ගැනීම උදෙසා VTA ආයතනය හා ශ්‍රම වාසනා අරමුදල අතර ඇති කර ගත් ද්වීපාර්ශ්වික ගිවිසුම.



**VTA ආයතනය හා ශ්‍රම වාසනා අරමුදල අතර ඇති කර ගත් ද්වීපාර්ශ්වික ගිවිසුම.**

- ශ්‍රම වාසනා අරමුදලේ අනුග්‍රහයෙන් පවත්වනු ලබන ජාතික සම්පත ලොතරැයියේ දිනුම් ජයග්‍රහයකයා වෙත ප්‍රදානය කරන ලද අවස්ථා




ශ්‍රම වාසනා අරමුදලේ අනුග්‍රහයෙන් පවත්වනු ලබන ජාතික සම්පත ලොතරැයියේ දිනුම් ජයග්‍රහයකයා වෙත ප්‍රදානය කරන ලද අවස්ථාව

- පාර්ලිමේන්තුවේ සම්මත කරගත් වාර්ෂික වාර්තාව ගරු අමාත්‍යතුමා වෙත පිරිණැමූ අවස්ථාව




වාර්ෂික වාර්තාව ගරු අමාත්‍යතුමා වෙත පිරිණැමූ අවස්ථාව

## පාලන ව්‍යුහය

1998 අංක 12 දරණ පනතේ ස්ථාපිත ශ්‍රම වාසනා අරමුදල කම්කරු අමාත්‍යාංශය යටතේ පවතින අතර එහි සභාපතිත්වය කම්කරු අමාත්‍යාංශයේ ලේකම් සතුවේ.

ශ්‍රම වාසනා අරමුදල් පනතට අනුව අරමුදලේ පාලන කටයුතු පිළිබඳ සම්පූර්ණ වගකීම ශ්‍රම වාසනා අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති අතර අරමුදල කළමණාකරණය හා ඊට අදාළ කටයුතු සියල්ල එම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත.

ශ්‍රම වාසනා අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වේ.

## අධ්‍යක්ෂ මණ්ඩලය - ශ්‍රම වාසනා අරමුදල

| නම | තනතුර |
|---|---|
| ඩබ්. ජේ. එල්. යූ. විජයවීර | සභාපති |
| පර්ල් වීරසිංහ මිය | සාමාජික |
| රංජිත් හෙට්ටිආරච්චි මහතා | සාමාජික |
| යූ. ලලිත් චන්ද්‍රසිරි වික්‍රමසිංහ මහතා | සාමාජික |
| පී. කේ. එම්. ජයතිස්ස මහතා | සාමාජික |
| එස්. ඩබ්. සී. ජයමිණී මිය | සාමාජික |
| ඩී. ආර්. ජයලත් මහතා | සාමාන්‍යාධිකාරී - ශ්‍රම වාසනා අරමුදල |
| ඊ.ඩබ්.ඒ.පී.පුණ්‍යසිරි මෙනවිය | ගණකාධිකාරී - ශ්‍රම වාසනා අරමුදල |
| ඩබ්. ආර්. එම්. නලීන් අසංක මහතා | වෙළඳ නාම කළමණාකරු - ජාතික ලොතරැයි මණ්ඩලය |
| | |

ශ්‍රම වාසනා අරමුදල විශ්‍රාම වැටුප් හිමිකම් නොලබන පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවකයන් ආවරණය වන පරිදි ඔවුන්ගේ සුභ සාධනය උදෙසා පිහිටුවා ඇති අතර වර්තමානයේදී වැඩි පිරිසක් වෙත සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම සඳහා පස් අවුරුදු සැලැස්මක් ක්‍රියාත්මක වෙමින් පවතී.

## ශ්‍රම වාසනා අරමුදල

# 2012

# අවසාන ගිණුම

### කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය

ශ්‍රම වාසනා අරමුදල් මණ්ඩලය

*2012/12/31 දිනට*

*ශේෂ පත්‍රය*

| | | | 2011 | | 2012 |
|---|---|---|---|---|---|
| | | | | | රුපියල් |
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| *දේපල යන්ත්‍ර හා උපකරණ* | සටහන 1 | 527,723.17 | | 598,482.17 | |
| *ස්ථාවර තැන්පත් ආයෝජන* | | 67,500,000.00 | 68,027,723.17 | 61,500,000.00 | 62,098,482.17 |
| **ජංගම වත්කම්** | | | | | |
| තොගය | | 78,908.25 | | | |
| *වෙලඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ* | සටහන 2 | 119,234,191.00 | | 170,561,863.33 | |
| *බැංකු ශේෂය* | | 269,152.85 | 119,582,252.10 | 2,868,073.71 | 173,429,937.04 |
| ***මුළු වත්කම්*** | | | 187,609,975.27 | | 235,528,419.21 |
| **සංචිත හා වගකීම්** | | | | | |
| *සමුච්චිත අරමුදල* | සටහන 3 | | 187,394,975.27 | | 234,601,914.65 |
| **ජංගම වගකීම්** | | | | | |
| *වෙලඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ* | සටහන 4 | | 215,000.00 | | 926,504.56 |
| **සංචිත හා වගකීම්** | | | 187,609,975.27 | | 235,528,419.21 |

ඩබ්ලිව්.ජේ.එල්.යූ.විජයවීර
සභාපති
ශ්‍රම වාසනා අරමුදල
**W. J. L. U. Wijayaweera**
**Secretary**
**Ministry of Labour & Labour Relations**
**02nd Floor, Labour Secretariat**
**Colombo - 05.**

පර්ල් වීරසිංහ
අධ්‍යක්ෂ
ශ්‍රම වාසනා අරමුදල
V. B. P. K. Weerasinghe
Commissioner General of Labour
Department of Labour
Colombo - 05

ඩී.ආර්.ජයලත්
සාමාන්‍යාධිකාරී
ශ්‍රම වාසනා අරමුදල
Mr. D. R. Jayalath
**General Manager**
**Shrama Vasana Fund**
**Ministry of**
**Labour & Labour Relations**

ඒ.ඩබ්.ඒ.පී.පුණ්‍යසිරි
ගණකාධිකාරී
ශ්‍රම වාසනා අරමුදල
ඒ. ඩබ්. ඒ. පී. පුණ්‍යසිරි
ගණකාධිකාරී.
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය
නාරාහේන්පිට, කොළඹ 05

*ශ්‍රම වාසනා අරමුදල් මණ්ඩලය*

*2012/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා*

*ආදායම් වියදම් ගිණුම*

| | | | රු.ශත | | රු.ශත |
|---|---|---|---|---|---|
| | | | **2011** | | **2012** |
| *ආදායම* | සටහන 6 | | **46,646,919.78** | | **55,233,284.17** |
| අඩු කලා: අරමුදලේ වියදම් | | | | | |
| *ආයතන හා පරිපාලන වියදම්* | සටහන 7 | 3,325,884.26 | | 3,431,371.97 | |
| *ක්ෂය* | සටහන 8 | 114,362.87 | | 134,397.00 | |
| *අරමුදලේ අරමුණු ඉටු කිරීමේ වියදම්* | සටහන 9 | 2,988,505.72 | | 4,466,175.82 | |
| අරමුදලේ වියදම් එකතුව | | | **6,428,752.85** | | **8,031,944.79** |
| *සමුච්චිත අරමුදල (2012 වර්ෂයේ අතිරික්තය)* | | | **40,218,166.93** | | **47,201,339.38** |

**ශ්‍රම වාසනා අරමුදල් මණ්ඩලය**

***2012/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා***

***මුදල් ප්‍රවාහ ප්‍රකාශය***

| | | | රුපියල් |
|---|---|---|---|
| *2012 වර්ෂයේ අතිරික්තය* | සටහන 10 | | 47,206,939.38 |
| **ගැලපීම්** | | | |
| *ක්ෂය* | | 134,397.00 | |
| *ආයෝජන පොලී* | | (5,428,381.92) | |
| *ආපදා ණය පොලී* | | (7,157.25) | (5,301,142.17) |
| *අතිරික්තය කාරක ප්‍රාග්ධනයේ වෙනසට පෙර* | | | 41,905,797.21 |
| *තොගය අඩු වීම* | | 78,908.25 | |
| *වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ වැඩිවීම* | | (49,811,460.00) | |
| *වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ වැඩි වීම* | | 711,504.56 | (49,021,047.19) |
| *මෙහෙයුම් මුදල් ප්‍රවාහය* | | | (7,115,249.98) |
| | | | |
| **ආයෝජන කටයුතු** | | | |
| *ස්ථාවර වත්කම් මිලට ගැනීම්* | | (205,156.00) | |
| *ආයෝජන පොලී* | | 3,912,169.59 | |
| *ආපදා ණය පොලී* | | 7,157.25 | |
| *ආයෝජන* | | 6,000,000.00 | |
| *ආයෝජන මුදල් ප්‍රවාහය* | | | 9,714,170.84 |
| *2012 වසරේ මුදල් ප්‍රවාහය* | | | **2,598,920.86** |
| *2012.01.01 මුදල් හා මුදල් සමාන වත්කම්* | | | 269,152.85 |
| *2012.12.31 මුදල් හා මුදල් සමාන වත්කම්* | | | 2,868,073.71 |

## පාද සටහන්

### සටහන 1

**දේපල යන්ත්‍ර හා උපකරණ**

| | පිරිවැය | එකතු කිරීම් | ක්ෂය | සමු.ක්ෂය | ශු.අගය |
|---|---|---|---|---|---|
| යන්ත්‍ර උපකරණ | 240,480.00 | - | 24,048.00 | 52,912.00 | 187,568.00 |
| වායුසමීකරණ | 97,185.00 | - | 3,380.00 | 87,044.00 | 10,141.00 |
| පරිඝණක | 429,776.00 | 26,558.00 | 73,146.00 | 303,401.50 | 152,932.50 |
| ඡායාපිටපත් යන්ත්‍ර | 96,187.50 | - | | 96,186.50 | 1.00 |
| ගෘහභාණ්ඩ | 29,855.00 | 159,398.00 | 14,194.00 | 39,663.39 | 149,589.61 |
| කාර්යාල උපකරණ | 242,523.14 | 19,200.00 | 19,629.00 | 163,473.08 | 98,250.06 |
| | 1,136,006.64 | 205,156.00 | 134,397.00 | 742,680.47 | 598,482.17 |

### සටහන 2

**වෙළද හා අනෙකුත් ලැබිය යුතු දෑ**

| | |
|---|---|
| භාණ්ඩාගාර මෙ.අ.ප. | 165,917,931.00 |
| උත්සව අත්තිකාරම් | 6,000.00 |
| ආපදා ණය | 164,220.00 |
| ස්ථාවර තැන්පත් ආයෝජන පොලී | 4,473,712.33 |
| | 170,561,863.33 |

### සටහන 3

| | |
|---|---|
| සමුච්චිත අරමුදල 2012.01.01 | 187,400,575.27 |
| 2012 වර්ෂයේ අතිරික්තය | 47,201,339.38 |
| සමුච්චිත අරමුදල 2012.12.31 | 234,601,914.65 |

### සටහන 4

**වෙළද හා අනෙකුත් ගෙවිය යුතු දෑ**

| | |
|---|---|
| විගණන ගාස්තු වෙන් කිරීම | 75,000.00 |
| සේ. නි. විරුද්ධව පරීක්ෂණ වලදී නීති ආධාර වෙන් කිරීම | 97,500.00 |
| අතිකාල දීමනා | 3,145.33 |
| දුරකථන වියදම් | 4,499.30 |
| සේ. නි. සුභසාධනය ප්‍රවර්ධනය | 619,921.70 |
| ප්‍රචාරක වියදම් | 112,500.00 |
| විදුලි හා ජල ගාස්තු | 13,938.23 |
| | 926,504.56 |

**සටහන 5**

*ස්ථාවර වත්කම් පහත ක්ෂය අනුපාත මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කර ඇත.*

| | |
|---|---|
| *යන්ත්‍ර උපකරණ* | 10% |
| *වායුසමීකරණ* | 20% |
| *පරිගණක* | 25% |
| *ජායාපිටපත් යන්ත්‍ර* | 20% |
| *විධායක ගෘහභාණ්ඩ* | 7.50% |
| *කාර්යාල උපකරණ* | 7.50% |

* *ක්ෂය කල හැකි අගය අවසන් වත්කම් වල සුන්බුන් අගය රු.1.00 වන තෙක් ක්ෂය කර ඇත.*

**සටහන 6**

**ආදායම**

| | |
|---|---|
| *ශ්‍රම වාසනා ලොතරැයි ආදායම* | 49,797,745.00 |
| *ස්ථාවර තැන්පතු පොලී ආදායම* | 5,428,381.92 |
| *ආපදා ණය පොලිය* | 7,157.25 |
| | 55,233,284.17 |

5

**සටහන 7**

**ආයතන හා පරිපාලන වියදම්**

| | |
|---|---:|
| *සේවක වැටුප්* | 946,209.41 |
| *සේවක අර්ථසාධක අරමුදල* | 113,773.57 |
| *සේවා නියුක්තියන්ගේ භාර අරමුදල* | 28,443.39 |
| *අතිකාල දීමනා* | 42,383.26 |
| *ජීවන වියදම් දීමනා* | 395,466.45 |
| *අතුරු මාසික දීමනා* | 60,000.00 |
| *අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික දීමනා* | 48,000.00 |
| *ප්‍රසාද දීමනා* | 50,000.00 |
| *ගමන් වියදම් සහ සංයුක්ත දීමනා* | 8,164.00 |
| *ලිපි ද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා සැපයුම්* | 264,985.00 |
| *ඉන්ධන සැපයුම්* | 254,195.00 |
| *ප්‍රවාහන වියදම්* | 388,965.20 |
| *තැපැල් වියදම්* | 16,010.00 |
| *දුරකථන වියදම්* | 72,450.98 |
| *කාර්ය මණ්ඩල සුභසාධනය* | 17,055.50 |
| *සංග්‍රහ වියදම්* | 23,341.00 |
| *විවිධ වියදම්* | 7,810.10 |
| *විගණන ගාස්තු* | 25,000.00 |
| *විගණන කමිටු දීමනා* | 18,000.00 |
| *ප්‍රායෝගික පුහුණු දීමනා* | 323,600.00 |
| *විදුලි හා ජල ගාස්තු* | 326,399.11 |
| *බැංකු ගාස්තු* | 1,120.00 |
| | 3,431,371.97 |

**සටහන 8**

**ක්ෂය**

| | |
|---|---:|
| පරිඝණක ක්ෂය | 73,146.00 |
| වායුසමීකරණ ක්ෂය | 3,380.00 |
| ඡායාපිටපත් යන්ත්‍ර ක්ෂය | - |
| ගෘහභාණ්ඩ ක්ෂය | 14,194.00 |
| කාර්යාල උපකරණ ක්ෂය | 19,629.00 |
| යන්ත්‍ර උපකරණ ක්ෂය | 24,048.00 |
| | 134,397.00 |

**සටහන 9**

**අරමුදලේ අරමුණු ඉටු කිරීමේ වියදම්**

| | |
|---|---|
| සේ. නි. සුභසාධනය ප්‍රවර්ධනය | 3,111,118.93 |
| සේ. නි. පරීක්ෂණ වලදී නීති ආධාර සැපයීම | 8,750.00 |
| *ප්‍රචාරක වියදම්* | 1,346,306.89 |
| | 4,466,175.82 |

**සටහන 10**

| | |
|---|---|
| 2012 වර්ෂයේ අතිරික්තය | 47,201,339.38 |
| (+`සමුච්චිත අරමුදලට ගැලපීම් | 5,600.00 |
| 2(12 වර්ෂයේ අතිරික්තය (මුදල් ප්‍රවාහ ප්‍රකාශය) | 47,206,939.38 |

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No: එල්එස්/සී/එස්වීඑෆ්/එෆ්ඒ/2012
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2013ඔක්තෝබර් 29 දින.


සභාපති,
ශ්‍රමවාසනා අරමුදල.

**ශ්‍රම වාසනා අරමුදලේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව.**

---

ශ්‍රම වාසනා අරමුදලේ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල් පනතේ 12(4) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණන සිදුකරන ලදී. අචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.


අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone: 2887028 - 34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail: oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තිරණය කිරීම සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1 මතය**

------

2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රම වාසනා අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරෙන් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---------------------------------------

**2.2.1 උසස් ගිණුම්කරණ පරිචයන්**

------------------------------

සරල මාර්ග ක්‍රමය අනුව පිරිවැය රු.340,222ක වායු සමීකරණ, පරිගණක, ඡායා පිටපත් යන්ත්‍ර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අවසන් අගය රු.1 තෙක් ක්ෂය කිරීම සිදුකර තිබුණු අතර, එම වත්කම් ප්‍රත්‍යාගණනය කර නව ඵලදායී ජීව කාලය හඳුනාගෙන ඒ අනුව ක්ෂය ගැලපීම සිදුකර නොතිබුණි.

### 2.2.2 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල් පනත | |
| (i) 6 (අ) සිට (ඊ) දක්වා වගන්ති | පනතේ සඳහන් අරමුණුවලට පටහැනිව රු.781,332ක් ප්‍රචාරක වියදම් ලෙස වැයකර තිබුණි. |
| (ii) 7 (2) (1) (අ) හා 13(2) වගන්ති. | පනතට අනුව ශ්‍රම වාසනා නමින් ලොතරැයියක් මුද්‍රණය කළ යුතු වුවත්, ඊට පටහැනිව "ජාතික සම්පත" නමින් ලොතරැයියක් මුද්‍රණය කිරීම. |
| (iii) 10 (ඇ) වගන්තිය | ලොතරැයි පැවැත්වීමෙන් ලැබෙන ආදායම් අරමුදලට ලැබිය යුතු වුවත් 2008 පෙබරවාරි 28 දිනෙන් පසුව එම ආදායම් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ලබා ගෙන නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ 139 (4) | ප්‍රචාරක වියදම් වශයෙන් අරමුදලෙන් දැරූ රු.1,346,307ක් සඳහා විධිමත් කුවිතාන්සි ලබාගෙන නොතිබීම. |
| (ii) මු.රෙ 139 (8) | සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබූ රු.381,000ක අත්තිකාරම් ලේඛනයක සටහන් කර නොතිබීම. |
| (iii) මු.රෙ 371 (2) (ඇ) | සමාලෝචිත වර්ෂයේදී නිකුත්කර තිබුණු රු.121,000ක අත්තිකාරම් පියවීමට අදාළ කාර්ය නිමකර මාසයකට වැඩි කාලයක් පමාකර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.47,201,339ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.40,218,167ක් වූයෙන් රු.6,983,172ක මූල්‍ය ප්‍රතිඵලයේ වැඩිවීමක් පෙන්නුම් කෙරිණි. සමාලෝචිත වර්ෂයේ වියදම පසුගිය වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 1.6කින් වැඩි වුවත්, සමාලෝචිත වර්ෂයේ ආදායම රු.මිලියන 8.5කින් වැඩිවීම මෙයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

#### 4.1.1 මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂයේ ශ්‍රම වාසනා අරමුදලේ ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තා පරීක්ෂා කිරීමේදී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) **මූල්‍ය හා භෞතික ඉලක්කයන් ඉටු කර ගැනීමේ ප්‍රගතිය**

පහත නිරීක්ෂණයන් කෙරේ.

| වැඩසටහන/සංරචකය | 2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ඉලක්ක | | ඉටුකර ගැනීම් (කාර්ය සාධනය) | | ඉටුකර ගැනීමේ ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|
| | මූල්‍ය | භෞතික | මූල්‍ය | භෞතික | මූල්‍ය | භෞතික |
| | රු.මිලියන | වැඩසටහන් | රු.මිලියන | වැඩසටහන් | | |
| (i) කාර්මික අධ්‍යාපන වැඩසටහන් | 0.6 | 20 | - | - | - | - |

(මෙම වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.)

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ii) හදිසි අවස්ථාවලදී සේවා නියුක්තයන්ට වෛද්‍ය හා වෙනත් පහසුකම් සැපයීම | 1.0 | රෝගීන් 20 දෙනෙක් සඳහා | | - | - | - |
| | | | (මෙම වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.) | | | |
| (iii)නීති ආධාර වැඩසටහන් | 1.0 | පුද්ගලයන් 100ක් සඳහා නීති ආධාර සැපයීම | 0.07 | පුද්ගලයන් 18 දෙනෙකු සඳහා නීති ආධාර සැපයීම | 7% | 18% |

(ආ) ශ්‍රම වාසනා පනතෙහි දක්වා ඇති කටයුතු ඉටු නොකිරීම

---------------------------------------------------------------

1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල පනතේ පහත සඳහන් වගන්ති යටතේ දැක්වෙන කටයුතු අරමුදල විසින් ඉටුකර නොතිබුණි.

| | වගන්තිය | ඉටුනොවීම් පිළිබඳ විස්තර |
|---|---|---|
| (i) | 6 (ආ) වගන්තිය | සේවා නියුක්තිකයන් සේවයෙහි යෙදී සිටි ආයතන පූර්ව දැනුම් දීමකින් තොරව වසා දැමූ අවස්ථාවක ඒ සේවා නියුක්තිකයන්ට මූල්‍ය හා වෙනත් ආධාර සැපයීම. |
| (ii) | 6 (ඇ) වගන්තිය | හදිසි අවස්ථාවලදී සේවා නියුක්තිකයන්ට වෛද්‍ය හා වෙනත් පහසුකම් සැපයීම. |
| (iii) | 6 (ඉ) වගන්තිය | ව්‍යසන අවස්ථාවලදී සේවා නියුක්තිකයන්ට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ සැපයීම. |
| (iv) | 13 (1) වගන්තිය | එක් එක් වර්ෂයේ මුද්‍රණය කළ යුතු ලොතරැයි සංඛ්‍යාව හා වර්ග පිළිබඳව ලොතරැයි මණ්ඩලය සමඟ එකගත්වයකට පැමිණීම. |
| (v) | 13 (2) වගන්තිය | ලොතරැයියෙන් ප්‍රදානය කරන තෑගි පිළිබඳව හා හිමිකම් නොපෑ තෑගී පිළිබඳව කටයුතු කළ ආකාරය පිළිබඳ ලොතරැයි මණ්ඩලය සමඟ එකගත්වයකට පැමිණීම. |
| (vi) | 13 (3) වගන්තිය | ලොතරැයියෙන් ප්‍රදානය කළ යුතු තෑගීවල වටිනාකමද ඇතුළුව ලොතරැයි මණ්ඩලය විසින් දැරිය යුතු වියදම් සම්බන්ධයෙන් අරමුදල හා ලොතරැයි මණ්ඩලය අතර එකගත්වයක් ඇතිකර ගැනීම. |

**4.2** **මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

-----------------------------------

**පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.**

(අ) පනතේ අරමුණුවලට පටහැනිව අරමුදල මඟින් වෙනත් ආයතන වෙත රු.1,102,000ක මුදලක් විවිධ කාර්යයන් සඳහා ලබා දීම.

(ආ) 2012 වර්ෂයට අදාළ වෛද්‍ය සායන තුනක් සඳහා ක්‍රියාකාරී සැලැස්ම අනුව රුපියල් මිලියන 1.5ක් ඇස්තමේන්තු කර තිබූ අතර, එය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අනුව රු.782,000ක් විය. සමාලෝචිත වර්ෂයේ එහි සත්‍ය වියදම රු.602,293 ක් වේ. 2012 මාර්තු 03 දින පැවැත්වූ සායනය සඳහා අහාර පාන මිලදී ගෙන ඒ සඳහා ප්‍රසම්පාදන කමිටු ආවරණ අනුමැතිය ලබා ගෙන තිබුණේ 2012 අප්‍රේල් 19 දිනයේදීය. මෙහිදී ආහාර පාන සඳහා වර්තමාන වෙළඳපොළ මිල ගණන් වලට වඩා අධික මිල ගණන් වැය කර තිබුණි. පිළියන්දල පැවැත්වූ සායනය සඳහා පැමිණීමේ වාර්තා අනුව 28 දෙනෙකුගේ පැමිණීම සනාථ කර 50 දෙනෙකුට වඩා ආහාර සැපයීම කර තිබුණි.

**5.** **ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය**

----------------------------------------

**5.1** **සංයුක්ත සැලැස්ම**

--------------------

2003 ජුනි 02 දින හා අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 05 ජේදය ප්‍රකාරව ආයතනයේ දර්ශනය හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා වර්ෂ 03 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.2** **ක්‍රියාකාරී සැලැස්ම**

---------------------

සංයුක්ත සැලැස්මේ ඇතුළත් දෑ ඉටුකර ගැනීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.3** **අභ්‍යන්තර විගණනය**

------------------------

සමාලෝචිත වර්ෂයේදී අරමුදලේ අභ්‍යන්තර විගණනය සඳහා විගණකවරයෙකු කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය මඟින් පත්කර අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

6

6. **පද්ධති හා පාලනයන්**

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අරමුදලේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය.

(ආ) අයවැය පාලනය.

(ඇ) අත්තිකාරම් ගෙවීම.

(ඈ) ස්ථාවර වත්කම් පාලනය.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න,
වැඩබලන විගණකාධිපති.